2023 සැප්තැම්බර්

# MMCA ශ්‍රී ලංකා සහ Selyn සීමිත සංස්කරණ රෙදිපිළි මාළාවක් හඳුන්වා දෙයි.

- ජෝර්ජ් කීට්ගේ සිතුවම් දෙකකින් ආභාසිත සරම් හා සළු කලා ලෝලී සියල්ලන් ම එකතුකළ යුතු ඒවායි!

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) Selynහි Design for Impact මුලපිරීම හා සහයෝගයෙන් ජෝර්ජ් කීට්ගේ (1901–1993) සිතුවම් දෙකකට ප්‍රතිචාර දක්වන රෙදිපිළි කට්ටලයක් නිර්මාණකර ඇත. මෙම සීමිත සංස්කරණ සරම සහ සළු දෙක 'The Kandyan Bride' (1951) හා 'The Offering' (1948) යන සිතුවම් දෙකෙහි නිර්මාණය හා ලක්ෂණ යොදා නිමවා ඇත. 2023 මාර්තු මස නිමාවූ MMCA ශ්‍රී ලංකාහි දෙවන ප්‍රදර්ශනයවන 'මුණගැසීම්හි' තෙවන වටමාරුවේ මෙම සිතුවම් දෙක ම ප්‍රදර්ශනය විය.

මෙම සිතුවම් දෙකට ප්‍රතිචාරයක් ලෙස සුවිශේෂ Selyn රෙදිපිළි නිර්මාණය කිරීමට MMCA ශ්‍රී ලංකාහි ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා, Selynහි අධ්‍යක්ෂක සෙලීනා පීරිස් වෙත ඇරයුම් කිරීමෙන් මෙම සහයෝගීත්වය පටන්ගත්තේ ය. ඒ පිළිබඳ කතාකරමින් පෙරේයිරා පැවසුවේ, "Selyn සමඟ කළ මේ මුලපිරීමෙහි ප්‍රතිඵලය පිළිබඳව අපි අතිශයින් සතුටට පත්වෙනවා. මොකද එය සමකාලීන නිර්මාණශිල්පීන්ගේ උදව්වෙන් නූතන කලාකරුවන්ගේ කෘති දෙස අපිට අලුතින් බැලිය හැකි ආකාර පෙන්වා දෙන නිසා. අතිවිශිෂ්ට ලෙස ගෙත්තම් කෙරුණු හා, මේ රටේ කලා ඉතිහාසයන්ට සම්බන්ධ කතාවල සංකල්පමය වශයෙන් මුල් බැසගත් භාණ්ඩ Selynහි නිර්මාණශිල්පීන් නිපයා තිබෙනවා. මහා පරිමාණ වාණිජමය නිෂ්පාදනවල සිට එකතුකළ හැකි සීමිත සංස්කරණ භාණ්ඩ වෙත මාරුවීමට ඔවුන්ට ඇති කාර්යශූරත්වය, සැමරිය යුතු එකක් හා අනිවාර්යයෙන් ම දිගට ම කරගෙන යා යුතු එකක් වෙනවා" යනුවෙනි.

ජෝර්ජ් කීට්ගේ සිතුවම් දෙක නැරඹීමට MMCA ශ්‍රී ලංකාවට පැමිණි පසු, Selynහි නිර්මාණශිල්පීන්ට කීට් තම සිතුවම් දෙකෙහි—විශේෂයෙන් ම 'The Kandyan Bride' (1951)හි කාන්තා රූපය ඇඳ සිටින ඔසරිය නොහොත් උඩරට සාරිය සම්බන්යෙන්— නිරූපණයකරන විශේෂණීය රෙදිපිළි හඳුනාගත හැකි විය. ඉන්පසු එම රෙදිපිළි තවත් ගැඹුරින් අධ්‍යයනය කිරීමට ගිය ඔවුහු, එළැඹූ මාස තුන තුළ එක් එක් සිතුවමට ප්‍රතිචාර දක්වන සුවිශේෂී අත්කම් රෙදිපිළි නිර්මාණ තුනක් වර්ධනයකළහ. සීමන්තනි වඳුරාගල, යෝලා හොශිල්ඩ්, සහ ලක්ෂානි ජයතිලක යන නිර්මාණශිල්පීන් යොදාගත් සංකීර්ණ ලක්ෂණ හා වර්ණ කීට්ගේ වර්ණ භාවිතයට ප්‍රතිචාරය දැක්වූවා පමණක් නොව, සෑම සිතුවමක ම අන්තර්ගතය සංකල්පීය වශයෙන් ගවේෂණයකළේ ය.

උදාහරණයක් ලෙස, කීට්ගේ 'The Offering' (1948) සිතුවමට ප්‍රතිචාරක් ලෙස නිර්මාණයකෙරුණු සළුව සිතුවමේ නිරූපිත රූපවල් දෙකෙහි වස්ත්‍ර එක් ඇඳුමකට සම්මිශ්‍රණය කරයි. එහෙයින් එම සළුව වම්පස ඇති රූපය පැළඳි කොටු සහිත ඇඳුම ආශ්‍රිතයෙන් කොළ හා දම් පැහැ තීරුවලින් සමන්විත අතර, එය සිතුවමේ දකුණුපස රූපයෙහි වස්ත්‍රයෙන් අභාසිත කැපීපෙනෙන තීරු සහිත තලයක් පසෙක හිඳී. කීට්ගේ කලාකෘති මෙන් මෙම සළුවෙහි ද සුවිශේෂී ජ්‍යාමිතික සංයුතියක් ඇති අතර, එය රූප දෙක හා ඒවායේ සිතුවමේ දෙපස සමමිතික ස්ථානගතකිරීම පිළිබඳව ඉඟි කරයි. රූප දෙක අතර ඇති සම්බන්ධතාවේ සංදිග්ධතාවයෙන් ආභාසය ලැබූ Selynහි නිර්මාණ සැලසුම් කණ්ඩායම, ලිංගික සමාජභාවය පිළිබඳ අනන්‍යතාවය පසෙකලා ඕනෑ ම කෙනෙකුට පැළඳිය හැකි සළුවක් නිර්මාණයකර ඇත. අනිත් රෙදිපිළි දෙක 'The Kandyan Bride' (1951) සිතුවමෙහි කාන්තා රූපය පැළඳි ඔසරියෙන් ආභාසය ලබා ඇත.

Selynහි අත්කම් රෙදිපිළි ශ්‍රී ලංකාවේ අත් යන්ත්‍ර රෙදි විවීමේ වර්ෂ 2500 පැරණි ඉතිහාසයකින් එන එකකි. සියලු ඇඳුම් සාධාරණ ගණුදෙනුවට ලැදි, වීගන්, හා කුරිරත්වයන් තොරවන අතර, Selynහි වඳුරාගල වැඩපොළෙහි කටයුතුකරන නිර්මාණකරුවන් විසින් අතින් වියනු ලැබේ.

MMCA ශ්‍රී ලංකා සමඟ ඇති සහයෝගිතාව පිළිබඳ කතා කරමින් Selynහි සෙලීනා පීරිස් පැවසුවේ, "හුරුපුරුදු දේ අනෙක් කලාකරුවන් සහ නිර්මාණශිල්පීන් අතින් පරිකල්පනය විය හැකි ආකාර සමරන මෙම සීමිත සංස්කරණ සරම් සහ සළු නිර්මාණයකිරීමට MMCA ශ්‍රී ලංකා සමඟ හවුල්වවීම පිළිබඳව අපි සතුටු වෙනවා. මෙම භාණ්ඩ පැළඳීමෙන් හා තෑගි කිරීමෙන් ඔබ Selyn පදනම සහ MMCA ශ්‍රී ලංකාවට සහාය වෙනවා" යන්නයි.

“Selynහි Design for Impact වැඩසටහන යටතේ මෙම ඇඳුම් නිෂ්පාදනයකර ඇති අතර, එය ශ්‍රී ලංකාවේ අත්කම් කර්මාන්තය සහ බහුතරයක් කාන්තාවන්වන එහි නිර්මාණශිල්පීන් පුනර්ජීවනයකිරීම, පෝෂණයකිරීම, හා ඔවුන් පිළිබඳව දැනුවත්කිරීම අරබයා ලොව ප්‍රමුඛ පෙළේ නිර්මාණ සැලසුම්කරුවන්, සන්නාම, විශ්ව විද්‍යාල, හා සංවිධාන සමඟ සහයෝගීව කටයුතුකිරීමට Selyn සහ Selyn පදනම ස්ථාපිතකළ ඒකාබද්ධ මුලපිරීමක් වෙනවා. කාන්තාවන්ට සංස්කෘතික ව්‍යවසායකත්ව, නායකත්ව සංවර්ධන, සහ මූල්‍ය කළමනාකරණ කුසලතා හා අවස්ථා ලබා දෙන MMCA ශ්‍රී ලංකා වැනි සංවිධානයක් සමඟ සහයෝගීව කටයුතුකිරීම පිළිබඳව අපි සතුටු වෙනවා,” යැයි ඇය තවදුරටත් කියා සිටියා ය.

ඔබගේ සීමිත සංස්කරණ සළුව හෝ සරම ඇනවුම් කිරීමට MMCA ශ්‍රී ලංකාහි ඉන්ස්ටග්‍රෑම් පිටුව instagram.com/mmcasrilanka/ හෝ ෆේස්බුක් පිටුව facebook.com/MMCAsrilanka/ හරහා සෘජු පණිවිඩයක් එවන්න.